**වර්ෂ 2023. 02.07 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මූලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 9.45 දක්වා කල්තැබීමට යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගී විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.30 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.35 |
| 3. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය | පෙ.ව. 08.40 |
| 4. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.40 |
| 5. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.20 |
| 6. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.30 |
| 7. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.31 |
| 8. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.35 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 09.38 |
| 10. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.39 |
| 11. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.40 |
| 12. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 09.44 |
| 13. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | ඩබ්.කේ.තිලකාවති මිය | පෙ.ව. 09.44 |
| 14. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.45 |
| 15. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 09.45 |
| 16. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්. ජයලත් මහතා | පෙ.ව.09.45 |
| 17. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 09.55 |
| 18. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බන්ඩාර මිය | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 10.00 |
| 20. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 10.00 |
| 21. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 10.00 |
| 22. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 10.00 |
| 23. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 10.05 |
| 24. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 10.00 |
| 25. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක මහතා | පෙ.ව. 10.10 |
| 26. ගරු ප්‍රාසම | එ.ජා.ප. | රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව.. 10.10 |
| 27. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී.ජීවන් අබේවික්‍රමපාල මහතා | පෙ.ව. 10.30 |
| 28. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | 10.30 |
| 29. ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 10.30 |
| 30. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.40 |
| 31. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | ප.ව.10.40 |
| 32. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 11.00 |
| 33. ගරු ප්‍රාසම | එ.ජා.ප | මුදිතා ශ්‍රිමතී මිය | පෙ.ව. 11.00 |
| 34. ගරු ප්‍රාසම | එ.ජා.ප | මානෙල් කරදන මිය | පෙ.ව. 11.00 |
| 35. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 11.00 |
| 36. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | ප.ව. 11.00 |
| 37. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 11.05 |

01. පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

01-01.2023.01.04 මහා සභා රැස්වීම් වාර්තාව

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා :-**</u>

2023.01.04 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**</u>

23.01.04 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

<u>**සංශෝධන අංක 01**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -**</u>

**මම සභාවේ දිගින් දිගටම කිව්වා අර නඩුකාරදෙනිය මාර්ගය වැස්සට කඩාගෙන ගිහින් දැන් යන්නත් බැරිවෙනවා.ඒකට ඇස්තමේන්තු හැදුවාද?කාර්මික නිලධාරිව අරින්න.වාර්තාවේ 4 පිටුවේ මා විසින් කල ප්‍රකාශයේ විසල් යන්න විසල් ජල ව්‍යාපෘතිය ලෙස සංශෝධනය විය යුතුයි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා -**</u>

**වාර්තාවේ 4 පිටුවේ මාවිසින් විසල් ව්‍යාපෘතිය සඳහා පළුදුකල , පැතිබැම්ම බැඳීමට අනුමතව තිබූ මාර්ගය සම්බන්ධව කල ප්‍රකාශය විමලසිරි ජයලත් මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයක් ලෙස සටහන්ව ඇති අතර එය මා විසින් සිදුකල ප්‍රකාශයක් ලෙස සටහන් විය යුතුයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_2023.01.04 වන දින මහා සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

01- 02.2023.01.11 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා :-**</u>

2023.01.11 වන දින විශේෂ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**</u>

2023.01.11 වන දින විශේෂ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_**2023.01.11 වන දින විශේෂ සභා වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2023.01.04 මහා සභා රැස්වීම් වාර්තාව සහ 2023.01.11 වන දින විශේෂ සභා වාර්තාව ඉහත සංශෝදනයන්ට යටත්ව මහා සභා සම්මත වූ බව සහතික කරමි.

ප්‍රේමරත්න මල්කැකුල,
ගරු සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

02.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නොමැත.

03.ප්‍රාදේශිය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන

03-01.කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර මගින් යොමුකර ඇති මහා සභා තීරනය පිලිබඳ ලිපිය.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාවක් අනුව ර/ පත්බේරිය නාරද මහා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත් කිරිමට පැවැත්වු වැඩසටහනේ අයවැය සම්බන්ධ වාර්තාවක් පාසැල ඉදිරිපිට ප්‍රදර්ශනය කරනලෙස යෝජනා කරඇත.එහෙත් එම අයවැය වාර්තා ව පාසැල් සංවර්ධන විධායක කමිටුවේ අනුමැතිය සහිතව කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යොමු කරන අතර අනතුරුව එය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කරනු ලබන බවත් ඒ නිසා අයවැය පාසැල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරිම අනවශ්‍යබවත් දන්වා ඇත.**

**03-02.** **දිස්ත්‍රික් කාර්යාලය රත්නපුර** යොමුකර ඇති 2020/2021 ප්‍රජා ජල අභිමානි ව්‍යාපෘතිය පිලිබඳ **ලිපිය.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**එම ලිපියේ දන්වා ඇති පරිදි උක්ත සඳහන් ව්‍යාපෘතිය කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අපේක්ෂා ප්‍රජා මුල සංවිධානය මියනදෙනිය ව්‍යාපාතිය 2020 වර්ෂයේ ඉදිකිරිම ආරම්භ කල බවත් මෙම ව්‍යාපෘතිය මගින් පවුල් 700 සඳහා ජල සැපයුම් ලබා දිමට සැලසුම් කර ඇති බවත් පලමු හා දෙව න සැලසුම් අවසන් කර ඇති අතර පිරිපහදු පද්ධතිය හා නල එලීම යෝජිත ඉදිකිරිම්වේ.මෙ ඉතිරි ඉදිකිරිම් සඳහා රාජ්‍ය සහාය අවශ්‍ය බවත් දන්වා ඇති අතර ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානයටද යොමු කරනලෙස දන්වා ඇත.ඒ අනුව මෙම ලිපිය සභාගත කරමි.**

**03-02.2022.12.27 ප්‍රාදේශිය සම්බන්ධීකරන කමිටු සාකච්ජා සටහන්.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ප්‍රාදේශිය ලේකම් , කුරුවිට විසින් 23.01.25 දිනැති ව ඉහත කමිටුවට අදාල කමිටු සාකච්ජා සටහන් මෙම සභාව වෙත යොමු කරඇති අතර ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානයට යොමු කරමි.අදාල වාර්තාවඉදිරිපත්කරමි.**

04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නොමැත.

05.**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා-</u>**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

**05-01.කිවිලකොටුව මාර්ගයේ පියරත්න මයාගේ නිවස දෙසට යන මාර්ගයේ කඳු කොටස පැතිබැම්ම සකසා අඩි 150 ක් කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කිවිලකොටුව මාර්ගයේ පියරත්න මයාගේ නිවස දෙසට යන මාර්ගයේ කඳු කොටස පැතිබැම්ම සකසා අඩි 150 ක් කොන්ක්‍රිට්කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ ප්‍රාදේශීය සභා ගරු සභාපති **ප්‍රේමරත්න** මල්කැකුල_මහතා ගේ යෝජනාව අනුව **කිවිලකොටුව මාර්ගයේ පියරත්න මයාගේ නිවස දෙසට යන මාර්ගයේ කඳු කොටස පැතිබැම්ම සකසා අඩි 150 ක් කොන්ක්‍රිට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-02.පුස්සැල්ල සල්ගහපාර කැඩී ඇති පැතිබැම්මරු.800000.00ක් ප්‍රතිපාදන යොදා සැකසීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පුස්සැල්ල සල්ගහපාර කැඩී ඇති පැතිබැම්මරු.800000.00ක් ප්‍රතිපාදන යොදා සැකසීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ ප්‍රාදේශීය සභා ගරු සභාපති **ප්‍රේමරත්න** මල්කැකුල_මහතා ගේ යෝජනාව අනුව **පුස්සැල්ල සල්ගහපාර කැඩී ඇති පැතිබැම්මරු.800000.00ක් ප්‍රතිපාදන යොදා සැකසීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-03.පුස්සැල්ල වාඩියවත්ත පාර අඩි 100 ක්රු.400000.00ක ප්‍රතිපාදන යොදා කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පුස්සැල්ල වාඩියවත්ත පාර අඩි 100 ක්රු.400000.00ක ප්‍රතිපාදන යොදා කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ ප්‍රාදේශීය සභා ගරු සභාපති **ප්‍රේමරත්න මල්කැකුල**_මහතා ගේ යෝජනාව අනුව **පුස්සැල්ල වාඩියවත්ත පාර අඩි 100 ක්රු.400000.00 ක ප්‍රතිපාදන යොදා කොන්ක්‍රිට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxx

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

**05-04.එල්ලාවල දික්හේන ඇල ප්‍රජා ජල යෝජනා ක්‍රමය වැඩිදියුණුකිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**එල්ලාවල දික්හේන ඇල ප්‍රජා ජල යෝජනා ක්‍රමය වැඩිදියුණුකිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**මේවා හුදෙක් නිකම්ම යෝජනා නෙමෙයි.ජනතා ඉල්ලීම් අනුවයි මේවා ඉදිරිපත් කරන්නේ.මේ ජල යෝජනා ක්‍රමය මේ ප්‍රදේශයට ඉතා වැදගත්.බහුකාර්ය ගොඩනැගිල්ල ජාතික පාසැල,ඒවාටත් වැදගත්.මේ යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාට ඇරලා අවසර අරන් කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>

**අපි මේ යෝජනා සභාවට ඉදිරිපත් කරන්නේ නීත්‍යානුකූල කරන්නයි.ප්‍රතිපාදන ලබාගන්න පුළුවන්.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේ යෝජනා න්‍යාය පත්‍රයේ ඇතුලත් කලයුතු නිසා ඒ කටයුතුත සිදු කරනවා.මුදල් ලැබුනොත් කරනවා.යම් මුදලක් තියෙනවා.නඩත්තු හා පුනරාවර්තන දේට විතරයි.ඒවා සැලකිල්ලට ගෙන කටයුතු කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>

**මැතිවරන තියෙන මේ කාල සීමාවේ වැඩකිරිමට නීතිමය තත්වය මොකක්ද?**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**අපිට දැනුම් දීමක් සිදු කරලා නෑ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව **එල්ලාවල දික්හේන ඇල ප්‍රජා ජල යෝජනා ක්‍රමය වැඩිදියුණුකිරිම** සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxx

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.

**05-05.පැරඩයිස් ඉසුරු පෙදෙස මාර්ගයේ කැඩිබිඳී ගිය බෝක්කු පද්ධතිය සංවර්ධනය කිරිමට ප්‍රතිපාදන රු. 500000.00ක් ලබාගැනීමේ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා.**

**පැරඩයිස් ඉසුරු පෙදෙස මාර්ගයේ කැඩිබිඳී ගිය බෝක්කු පද්ධතිය සංවර්ධනය කිරිමට ප්‍රතිපාදන රු. 500000.00ක් ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා ගේ යෝජනාව අනුව **පැරඩයිස් ඉසුරු පෙදෙස මාර්ගයේ කැඩිබිඳී ගිය බෝක්කු පද්ධතිය සංවර්ධනය කිරිමට** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන **ප්‍රතිපාදන රු. 500000.00ක් ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

05-06.**කට්ටා දෙනිය බහුකාර්ය ගොඩනැගිල්ල සංවර්ධනය කිරිමසඳහා රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා.**

**කට්ටා දෙනිය බහුකාර්ය ගොඩනැගිල්ල සංවර්ධනය කිරිමසඳහා රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා ගේ යෝජනාව අනුව

කට්ටා දෙනිය බහුකාර්ය ගොඩනැගිල්ල සංවර්ධනය කිරිමසඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-07. කුරුවිට පැරඩයිස් හයිඩ්‍රාමනියට යාබද පාර කොන්ක්‍රිට් කිරිමට රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාගැනීමේ යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා.

**කුරුවිට පැරඩයිස් හයිඩ්‍රාමනියට යාබද පාර කොන්ක්‍රිට් කිරිමට රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා ගේ යෝජනාව අනුව **කුරුවිට පැරඩයිස් හයිඩ්‍රාමනියට යාබද පාර කොන්ක්‍රිට් කිරිමට** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන **රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක පතිරන මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

**05-08. පැරඩයිස් ලමා නිවාස පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්දනය කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා.

**පැරඩයිස් ලමා නිවාස පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්දනය කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරමු.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා ගේ යෝජනාව අනුව

**පැරඩයිස් ළමා නිවාස පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්දනය කිරිමට** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන **රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-09. කොස්ගොඩ අරලිය උයන ප්‍රධාන මාර්ගය පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්දනය කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාගැනිමෙ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා.

**කොස්ගොඩ අරලිය උයන ප්‍රධාන මාර්ගය පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්දනය කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරමු.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා ගේ යෝජනාව අනුව **කොස්ගොඩ අරලිය උයන ප්‍රධාන මාර්ගය පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්දනය කිරිමට** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන **රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-10.**වැළිහිඳ **ප්‍රධාන මාර්ගය ප්‍රධාන මාර්ගය පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්ධනය කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාගැනීමෙ යෝජනාව.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා.

**වැළිහිඳ ප්‍රධාන මාර්ගය ප්‍රධාන මාර්ගය පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්ධනය කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රුවන් අශෝක මහතා ගේ යෝජනාව අනුව **වැළිහිඳ ප්‍රධාන මාර්ගය පාර ප්‍රිමික්ස් යොදා කඩතොළු ස්ථාන සංවර්ධනය කිරිමට** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන **රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.

**මෙම අවස්ථාවේ ගරු මන්ත්‍රිතුමිය විසින් මෙම යෝජනා තුන පිලිබඳව සංශෝධනයක් සිදු කල අතර තමන් විසින් ලබාදුන් යෝජනා තුනේ අත්වරදකින් ප්‍රතිපාදන මුදල වැරදියට සඳහන් කර ඇති අතර එම යෝජනා ලිපියේද න්‍යාය පත්‍රයේද එම මුදල් පිලිවෙලින් පලමු යෝජනාව සඳහා රු.1000000.00, ක්ද දෙවන යෝජනාව සඳහා රු.1000000.00 ක්ද තෙවන යෝජනාව සඳහා රු. 500000.00 ලෙස සංශෝධනය කිරීමට යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් එම යෝජනාව** ස්ථිර කරන ලදී.

ඒ අනුව පහත පරිදි යෝජනා ස්ථිර කරන ලදී.

**05-11.දෙනිත්ත මාර්ගයේ සිට රූපා රංජනි මියගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.100000.00ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය

**දෙනිත්ත මාර්ගයේ සිට රූපා රංජනි මියගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.1000000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි. මුදල සංශෝධනය කර ඉදිරිපත් කරන ලදී.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ණි ප්‍රේමා ගම්ලත් මියගේ යෝජනාව අනුව **දෙනිත්ත මාර්ගයේ සිට රූපා රංජනි මියගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.1000000.00ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-12.කිරගල රබර් කර්මාන්ත අසල සිට පද්මසේන මහතාගේ නිවසදෙසට මාර්ගය ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.100000.00ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය

**කිරගල රබර් කර්මාන්ත අසල සිට පද්මසේන මහතාගේ නිවසදෙසට මාර්ගය ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.1000000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි. මුදල සංශෝධනය කර ඉදිරිපත් කරන ලදී.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ණී ප්‍රේමා ගම්ලත් මියගේ යෝජනාව අනුව **කීරගල රබර් කර්මාන්ත අසල සිට පද්මසේන මහතාගේ නිවසදෙසට මාර්ගය ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.1000000.00ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-13.දෙවිපහල ප්‍රධාන මාර්ගයේ සිට මල්ලිකා මියගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.100000.00ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය**

**දෙවිපහල ප්‍රධාන මාර්ගයේ සිට මල්ලිකා මියගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි. මුදල සංශෝධනය කර ඉදිරිපත් කරන ලදී.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ණී ප්‍රේමා ගම්ලත් මියගේ යෝජනාව අනුව **දෙවිපහල ප්‍රධාන මාර්ගයේ සිට මල්ලිකා මියගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.500000.00ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

05-14.සුදාගල ග්‍රාමනිලධාරි වසමේ දොඩම්ගස් හන්දිය නා කඳ ඇල හරහා ඇති මාර්ගයට හියුම්පයිප්ප යොදා පිලිසකර කරගැනීමට ලැබී ඇති හියුම් පයිප්ප 4 යොදා මාර්ගය සකසා ගැනිමට කටයුතු සලසාගැනීම සම්බන්ධ යෝජනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා**
මෙම යෝජනාවේ දොඩම්ගස් හන්දිය යන්න දෙමං හන්දිය ලෙස සංශෝධනය විය යුතුයි. ඒ අනුව සුදාගල ග්‍රාමනිලධාරි වසමේ දෙමං හන්දිය නා කඳ ඇල හරහා ඇති මාර්ගයට හියුම්පයිප්ප යොදා පිලිසකර කරගැනීමට ලැබී ඇති හියුම් පයිප්ප 4 යොදා මාර්ගය සකසා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **එස්.ඒ.මහින්ද විජේකුමාර මහතාගේ** යෝජනාව අනුව සූදාගල ග්‍රාමනිලධාරි වසමේ දෙමං හන්දිය නා කඳ ඇල හරහා ඇති මාර්ගයට හියුම්පයිප්ප යොදා පිලිසකර කරගැනීමට ලැබී ඇති හියුම් පයිප්ප 4 යොදා මාර්ගය සකසා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

05-15.වටප්පිටිය බෝධිරාජ මධ්‍යස්ථාන මාර්ගය ඉතිරි කොටස නඩත්තු කිරීම සඳහා **රු.800000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

අද දින **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා හදිසි අසනීප තත්වයක් මත සභාවට පැමිණීමට නොහැකි බව දැනුම් දුන් අතර එතුමාගේ යෝජනා ඉදිරිපත් කරන ලෙස මාවෙත දැනුම් දුන්නා.ඒ අනුව**
වටප්පිටිය බෝධිරාජ මධ්‍යස්ථාන මාර්ගය ඉතිරි කොටස නඩත්තු කිරීම සඳහා **රු.800000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු **සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලද ,**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **සම්පත් බොතේජු** මහතාගේ යෝජනාව අනුව වටප්පිටිය බෝධිරාජ මධ්‍යස්ථාන මාර්ගය ඉතිරි කොටස නඩත්තු කිරීම සඳහා **රු.800000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

05-16.පත්බේරිය පන්සල මාර්ගය නඩත්තු කිරිම සඳහා රු. **700000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

පත්බේරිය පන්සල මාර්ගය නඩත්තු කිරිම සඳහා රු. **700000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලද ,**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **සම්පත් බොතේජු මහතාගේ යෝජනාව** අනුව පත්බේරිය පන්සල මාර්ගය නඩත්තු කිරිම සඳහා රු. **700000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

05-17.පත්බේරිය කොට්ඨාශයේ ඇස්පෙනීම අඩු අය පරික්ෂාකර ඇස්කණ්නාඩි ලබාදීම සඳහා ජංගම සායනයක් සබරගමු පළාත් සභා සමාජ සුභසාධන අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක කරවීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

අද දින **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා හදිසි අසනීප තත්වයක් මත සභාවට පැමිණීමට නොහැකි බව දැනුම් දුන් අතර එතුමාගේ යෝජනා ඉදිරිපත් කරන ලෙස මාවෙත දැනුම් දුන්නා.ඒ අනුව**
පත්බේරිය කොට්ඨාශයේ ඇස්පෙනීම අඩු අය පරික්ෂාකර ඇස්කණ්නාඩි ලබාදීම සඳහා ජංගම සායනයක් සබරගමු පළාත් සභා සමාජ සුභසාධන අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක කරවීමට **යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලද ,**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **සම්පත් බොතේජු මහතාගේ යෝජනාව** අනුව පත්බේරිය කොට්ඨාශයේ ඇස්පෙනීම අඩු අය පරික්ෂාකර ඇස්කණ්නාඩි ලබාදීම සඳහා ජංගම සායනයක් සබරගමු පළාත් සභා සමාජ සුභසාධන අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක කරවීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

කල් දීඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත්කරන අනෙකුත් යෝජනා.

**2023.02.07 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-18 හි උද්ධෘතය**

05-18.කුරුවිට නගරයේ දෙල්ගහඹිවිට ඉඩමේ කඩ කාමර තුනක් ඉදිකරගැනීම සම්බන්ධව අවසර ඉල්ලා පුස්සැල්ල පරකඩුව එම්.ඒ.නවාස් මහතා විසින් යොමුකර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට නගරයේ දෙල්ගහඹිවිට ඉඩමේ කඩ කාමර තුනක් ඉදිකරගැනීම සම්බන්ධව අවසර ඉල්ලා පුස්සැල්ල පරකඩුව එම්.ඒ.නවාස් මහතා විසින් යොමුකර ඇති ඉල්ලීම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මෙතුමා නඩු දැම්මා මේ ඉඩම සම්බන්ධව.අවුරුදු දෙකක් විතර වෙනවා. නමුත් මේ නඩුව අවුරුදු 15,20 විතර යන එකක්.සාකච්ඡා කලාම කීවා එතන මේ ඉඩමේ අයිතිය ඇති එම්.ඒ නවාස්,මොහොමඩ් ඉම්තියාස්,නූර් වසිනා නෂිස් යන අයට කඩ තුනක් දාගන්න තැනක් දෙනවා නම් නඩුව ඉල්ලා අස්කරගන්න කැමතියිළු.අපිටත් ඉඩම වෙන්කරගන්න පුළුවන්.ඒකයි මේ යෝජනාව ඉදිරිපත් කලේ. මේ ඉල්ලීම ට එකඟ නම් මේ නඩුව ඉල්ලා අස්කර ගන්නවා කියලා කැමැත්ත ප්‍රකාශ කරලා අත්සන් කලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා

මේ ඉඩමට නඩුවක් තියෙනවා.මේ පැමිණිලිකරුවෙක්.පැමිනිලිකරුවෝ තව ඉන්නවාද?අදාල ගොණුව ගේන්න.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
තව පැමිනිලිකරුවෝ ඉන්නවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා
තව පැමිනිලිකරුවෝ ඉන්නවානම් නඩුව ඉවර වෙන්නේ නෑ.නඩුව යනවා.ඒක දීමෙන් වෙන්නේ තව කෙනෙකුට නඩුවට අදාල ස්ථානයක කඩ හැදුවා වගෙයි.මොහු පැමිනිලිකරුවෙක්.නමුත් අපි දීලා තියෙනවා නඩුවේ පාර්ශවයක් වත් නොවෙන අයට අනවසර ඉදිකිරීම් කරගන්න.මේක අක්කර දෙකයි රූඩ් 1යි.අඩි 60 ක් දීලා නඩුව අයින් කරන්න පුවවන්

නම් හොඳයි.මේ ඉඩම ආර්ථික අතින් ඉතා වැදගත්.මේ ඉඩම් ප්‍රමානය දුන්නාම නඩුව ඉවරවෙනවා නම් එකහයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

සභාවෙන් නඩු කියලා ඒක නිශ්ප්‍රභා උනා.සන්තකය නොගත් නිසා දැන් මේ නඩුව තව අවුරුදු 30 ක් වත් යයි.නඩුව සමාදාන වෙනවා නම් හොඳයි.නමුත් තවත් පාර්ශව ඉන්නවා.ඒ අය එක්ක මේක කොහොමද බේරගන්නේ.දැනටත් මේ ඉඩමේ අනවසර ඉදිකිරීම් තියෙනවා. ඒවා ඉවත් කරන්න කියලා කිව්වා. පසුගිය සභා වාර්තාවල තියෙනවා.නමුත් ඒවාට ක්‍රියාත්මක උනේ නෑ.ට්‍රාන්ස්පෝමරය පැත්තෙනුත් හදනවා.අළුතෙන්.නමුත් ඒවාට කිසිම විරෝධතාවක් නෑ.සභාවට විරුද්ධව නඩු දාපු අය එක්ක එකඟතාවකට එනවා නම් අනිත් අනවසර ඒවාත් එක්ක ගලපන්නේ කොහොමද?මෙතන අයිතියක් තියෙනවා කියලා සහතිකේකුත් නැනේ.පරන යෝජනාවකුත් තියෙනවා නාගරික සංවර්ධන අධිකාරියට කෝටියක් බැදලා පවරාගන්න කියලත්.මේවා නීතිඥවරු පළාත් පාලන කොමසාරිස් එක්ක කතා කරලා ගත යුතු තීන්දු.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති  අනිල් ලියනගේ මහතා</u>**

ගරු මන්ත්‍රිතුමන්ලා කීවා වගේ මේක අධිකරනයේ නඩුවක්.අපිට තීන්දු අරන් බලපෑම් කරන්න බෑ.නීතිඥ උපදෙස් ගත යුතුයි. සභාවේ න්‍යාය පත්‍රයට දාලා නීතිඥ උපදෙස් ගන්න.මේ නඩුවේ අපි එක ජයක් ගත්තත් සන්තකය ගැනීමේ ප්‍රමාදය එක්ක අපි තාම නඩු කියනවා.යුඩී එකට කෝටි ගානක් ගෙවන්නත් අපි එකඟ උනා.මෙහෙම එක එක තීරන අරන් පැලැස්තර දැම්මොත් මූලික හර පවිදතියට ඒක හානියක්.නිතිඥ එකගතාවය නැතුව එහෙම මොනාවත් අපිට තීරන ගන්න බෑ.දැනට ඇසෙන නඩුවක් මේක.එල්ආර්සී උපදෙස් අරන් අතරමැදි තත්වයට එන්නත් පුළුවන් වෙයි.1972 ට එහා අයිතියක් ගැනයි ඒ අය  කියන්නේ.අපි ඉවසමු. ඉක්මන් වෙන්න එපා.

අඩි 60ක් දීලා මේ විදිහට වැඩ කලොත් අපේ මූලික යෝජනාව බල රහිත වෙනවා.මේ ඉල්ලීමට කඩිනම් තීන්දු ගන්න එපා.මේ පිලිබඳව නීතිඥවරු  එක්ක සාකච්ජා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>**

සභාවේ වැදගත්ම ඉඩම.මේක රැකීම සභාවේ වගකීම.දිගු කාලයක් තුල සභාවේ වැදගත් වටිනා ඉඩම් සභාවට අහිමි වෙලා.අනවසරයෙන් අල්ලගෙන.ඒ ඉඩම් ගැන මන්ත්‍රීවරයා කීවට සභාව ඒ පිලිබඳව කටයුතු කලේ නෑ.ඒවා ඒ අයටම අයිතිවෙන්න ඉඩ  ඇරියා.මේ ඉඩම් නඩුවක් තියෙන ඉඩමක්.මේ කටයුත්ත කලොත් ඇත්තටම නරක පූර්වාදර්ශයක් වෙයි.පැමිනිල්ලට අල්ලස් දුන්නා වගෙයි.නීතයානුකූලව පැහැරගන්න ඉඩ තියන්න එපා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>**

2009 ඉඩන් මහජන පැමිනිලි.චන්ද්‍රලතා නඩු කිව්වා.උසාවි ගියා මම.මේ සම්බන්ධව උසාවිය දුන්න තීන්දු හරියට ක්‍රියාත්මක කලේ නැති නිසා අනවසර ඉදිකිරීම  මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් මැන වෙන් කරලා දීලා.කුරුවිට නගර සංවර්ධනය වෙනුවෙන් මේ ස්ථානයට මොනතරම් නඩු කිව්වද?ඒත් දැන් මේ වටිනාම ස්ථානයේ අනවසර ඉදිකිරීම නිසා නගරය අවලස්සන වෙලා.අපේ නඩු වලින් වැඩක් නැති උනා.සභාවට අයිතිය තියාගෙන ඒ ගැනු කෙනාට නීත්‍යානුකූලව හිමිවෙන්න ඇරියා.මම පෞද්ගලිකව වගෙයි මේකට ඒ තරමට මැදිහත් උනා මේ බිම නගර සංවර්ධනයට අරන් දෙන්න. ඒ නිසා මේ ඉඩම ගැන ඉතාමත් කල්පනාකාරිව වැඩ කරන්න. බොහෝ දෙනාගේ හිත සුව සඳහා වැඩකරන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

මේ බහුතර අදහස් අවබෝධයක් නැතිව වගෙයි.මේ ඉඩමට අක්කර එකයි රූඩ් දෙකයි.අපිට අක්කර එකයි රූඩ් එකයි.අනවසර ඉදිකිරීම්  තාවකාලිකව අවසර දුන්න ඒවා.ලෙස්ලිට යන්න

වෙලා. අනවසර ඉදිකිරීම් නඩු වලට ඒවා ඉවත් කරන්න කියලා. දින 14 ක් කල් දෙනවා අභියාචනා කරන්න.ඒක නිත්‍යානුකූල තත්වයක්. ඒක අභිබවා යන්න බෑ සභාවට.ඒ කාලයට කලින් අපිට කටයුතු කරන්න බෑ.සීජීආර් ඉඩම් තව අයට බදු දෙන එකත් අපිට නවත්තන්න බෑ.හැමෝම හිතන්නේ අපි මොනවත් කලේ නෑ කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

එහෙම දීලා නෑ.සන්තකය එහෙම දෙන්නෑ.ට්‍රාන්ස්පෝමරය අසල දැන් කම්බි ගහන්නත් පටන් අරන්.සභාවත් මුලින් දැනුවත් කලා.කම්මල තත්වය මොකක්ද?

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

ට්‍රාන්ස්පෝමරය අසල කටයුත්තටත් නඩු දානවා. එසේම උසාවියේ පිස්කල් කලයුතු දේවල් සභාවට කරන්න බෑ.ශීලා රමනී නඩුවට ඉන්න තැනක් දන්නෑ. අපි ඒගැන කියලා ලිපියක් දැම්මා.මේ දෙල්ගහඹිවිට ඉඩමේ කටයුත්තට අඩි 60 ක් දීලා හැකිනම් සාමාදානවෙමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>**

මෙහෙම නීති උසාවි මොකටද?වෙන කාට කියන්නද?පේලි නඩුව දිනුවා.නමුත් අපෙන් වන්දිත් ඉල්ලුවා.අන්තිමට කඩේ කරනවා පේලි. පේලිගෙන් ජරාව කාලද අහනවා ජනතාව.මම නම් කවදාවත් මේ පුද්ගලයාගෙන් කිසිදු ආකාරයක සුළු හෝ ප්‍රතිලාභයක් අරන් නෑ.

දැන් ශිලා රමනී නැතිළු.පිටරට ගිය අයත් අල්ලනවා. ඒ තැනැත්තිය බත්තරමුල්ලේ ඉන්නේ.ඒ නියෝගය අලවලා තිබ්බානම් ඒ ඇති. ඒක වලංගුයි.ලබන සභා වාරෙට අර පිස්කල් නියෝගය සම්බන්ද ප්‍රගතිය කියන්න.ඒක දෙන්න බැරි උනොත් නැවත අධිකරනයට යන්න.යූඩී එකත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

මේ යථාර්ථයයි පෙන්වා දුන්නේ.නඩුවක් දිනුවාම කඩිනමින් ඊට අදාල පියවර ගන්න ඕනි. පුද්ගලිකව අපි නඩුවක් දිනුවාම ඒ ගමන්ම ඉදිරි කටයුතු කරනවා.නීතිඥයා හම්බුවෙලා ඉදිරි කටයුතු කරනවා.කඩේ ගැලෙව්වා.උසාවි ගියා.තීන්දු ගත්තා.ඒවා ක්‍රියාත්මක කරන්න බැරි නම් වැඩක් නෑ. නිලධාරී ඒවා කරන්න ඕනි.දෙල්ගහවත්ත නඩු තියන ඉඩමක්.අපේ ලෝයර් එක්ක කතා කරලා තීන්දු ගමු. නීතිඥයා මේකේ වාසි අවාසි කියයි.සෝමරත්න මන්ත්‍රීතුමත් යන්න.ප්‍රගතිය සභාවට දාන්න.අපි එකඟතා ගමු.අනෙක් පාර්ශව එක්කත් කතා කරන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

මේ සම්බන්ධව තත්වය ඉදිරි සභාව දැනුවත් කරන්නම්.නීතිඥවරයා එක්ක කතා කරනවා.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන ලද , යෝජනාව අනුව හා කුරුවිට නගරයේ දෙල්ගහඹිවිට ඉඩමේ කඩ කාමර තුනක් ඉදිකරගැනීම සම්බන්ධව අවසර ඉල්ලා පුස්සැල්ල පරකඩුව එම්.ඒ.නවාස් මහතා විසින් යොමුකර ඇති ඉල්ලීම අනුව මේ සම්බන්ධව අදාල නීතිඥ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**2023.02.07 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-18 උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

05-19.පළාත් පාලන ආයතන හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ බැංකු ගිණුමක් විවෘත කිරිම සම්බන්ද ව නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමුකරඇති ලිපිය සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

පළාත් පාලන ආයතන හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ බැංකු ගිණුමක් විවෘත කිරිම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමුකරඇති ලිපිය සම්බන්ධව තීරනයක් ගැනීමට යෝජනා කරමි.ලිපිය සභාගත කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මෙම බල ප්‍රෙද්ශයේ නාගරික සංවර්ධන බල ප්‍රෙද්ශය තුල අනවසරයෙන් ඉදිකෙරෙන ගොඩනැගිලි සඳහා අය කරනු ලබන අනවසර සේවා ගාස්තු (දඩ මුදල් ) තැම්පත් කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් මත හා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය පරිදි
**උක්ත සදහන් ගිණුම ලංකා බැංකුවේ ආරම්භ කල නමුත් ඊට අදාල අප ලේඛනවල ගිනුම් ගැලපීමක් සිදු නොවන බව පෙන්වාදීමෙන් පසු එම ගිනුම අවලංගු කර එහි පවතින ශේෂය ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදල් ගිනුමට බැරකිරීමට 2014.05.22** දින පැවති මහ සභාවේදී අනුමැතිය ලැබී ඇත.නමුත් නාගරික සංවර්ධන අධිකාරියේ 2015.10.29 දිනැති ලිපියෙන් නැවත දන්වා ඇත්තේ එම ගිනුම විවෘත කර වසාදමා තිබුකාලය තුල කමිටුව විසින් අයකර ඇති දඩ මුදල් එම ගිනුමේ තැම්පත් කරන ලෙස බැවින් 2017.01.25 වන දින පැවති මෙහෙයුම් කමිටු තීරනය මගින් නැවත ගිනුම පවත්වාගෙන යාම නෛතික අවශ්‍යතාවක් බැවින් නොපමාව ගිනුම ආරම්භ කරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා ඇත.නමුත් මේවනවිටත් ගිනුමක් ආරම්භ කර නොමැත.මෙම තත්වය මත නාගරික සංවර්ධන අධිකාරියේ 23.01.07 දිනැති ලිපිය මගින් මෙම ගිනුමේ තොරතුරු විමසා ඇත.ඒ නිසා මෙම ගිනුම නැවත විවෘත කර පවත්වාගෙන යාම පිලිබඳව තීරයක් ගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

සභාවේ මුදල් සම්බන්ධ එක ගිනුමයි තියෙන්න ඕනි. බලංගොඩ නගර සභාව කසල ව්‍යාපෘතියට වෙනම ගිනුමක් හදලා අන්තිමට මේක වරදක් වෙලා මුල්‍ය අපරාධ විමර්ශන අංශය ටත් යන්න උනා.ඒ දඩ මුදල් වියදම් කරන්නේ අපි.ඉතින් වෙන ක්‍රම මොකටද?අපේ ගිනුමෙන් ඒ කටයුතු කල හැකියිනේ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

අපේ තියෙන්නේ ඒකාබද්ධ ගිනුම.මේ මුදල් නගර සංවර්ධනයටයි යන්නේ.හැම පළාත් පාලන ආයතනයටම මේ ගිනුම පිහිටුවිය යුතුයි.යූ.ඩී.පනතේ දඩ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

යු.ඩී.එක අත්සන් කරන්නවෙයි අපිට මුදල් ගන්න.හවුල් ගිනුමක දාලා දෙන්නම අත්සන් කරන්න වෙයි සල්ලි ගන්න.මේ සම්බන්දව මම දැනුවත් නෑ.මෙවැනි ගිනුමක් ආරම්භ කිරිම ගැන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

වෙන සභා වලිනුත් අහලා බලන්න.මෙහෙම අළුතෙන් ගිනුමක් අරඹලා තියෙන ඵලය මොකක්ද?

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
මේ පිලිබඳව තව දුරටත් විමසා බලා අනිවාර්ය කටයුත්තක් නම් පළාත් පාලන ආයතනය හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ බැංකු ගිණුමක් නීත්‍යානුකූලව විවෘත කිරීම සම්බන්ද ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන ලද , යෝජනාව** අනුව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමුකරඇති 23.01.17 දිනැති ලිපිය අනුව පළාත් පාලන ආයතනය හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ බැංකු ගිණුමක් නීත්‍යානුකූලව විවෘත කිරීම සම්බන්ද ව තව දුරටත් විමසා බලා අනිවාර්ය අවශ්‍යතාවයක් නම් ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

05-20.2022 වසර සඳහා සාමාජික ගාස්තු ගෙවන ලෙස එරත්න අඩවිකන්ද ඉන්දොල ජල පාරිභෝගික සමිතිය විසින් යොමුකර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

2022 වසර සඳහා සාමාජික ගාස්තු ගෙවන ලෙස එරත්න අඩවිකන්ද ඉන්දොල ජල පාරිභෝගික සමිතිය විසින් යොමුකර ඇති ඉල්ලීම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්ම දාස මහතා**
එම යෝජනාව ස්ථිර කරමි.ගරු ගාමිණී මන්ත්‍රීතුමා හිටිය කාලේ සිටම මේ ගෙවීම සිදු කර ඇත්තේ සභාවෙන් හදලා දීලා ඒ කාලේ පොදු වැසිකිලියක්.එරත්න පොදු වැසිකිලිය.ඒකට ඉන්දොල ඇල ජල පාරිභෝගිකසමිතියෙන් ජලය අරගෙන.මාසික සාමාජික මුදල රු. 150.00 යි.වාර්ෂිකව රු.1800.00 යි. ඒක මේ ඉල්ලන්නේ.එරත්න නගරය හා ශ්‍රී පාද වන්දනාවේ යන පිරිසට මේ වැසිකිලිය හදලා තියෙන්නේ.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
ඒ අනුව ඉන්දොල ඇල ජල පාරිභෝගික සමිතිය වෙත වාර්ෂික සාමාජික මුදල වන රු.1800.00 ක මුදල ගෙවමු. මේ මුදල 2022 වසර සඳහායි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන ලද , යෝජනාව අනුව හා** 2022 **වසර සඳහා සාමාජික ගාස්තු ගෙවන ලෙස එරත්න අඩවිකන්ද ඉන්දොල ජල පාරිභෝගික සමිතිය විසින් යොමුකර ඇති ඉල්ලීම අනුව** 2022 **වාර්ෂික සාමාජික මුදල වන** රු.1800.00 **ක මුදල එරත්න අඩවිකන්ද ඉන්දොල ජල පාරිභෝගික සමිතිය වෙත ගෙවීම් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

05-21.කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2023 වර්ෂය වෙනුවෙන් සකස්කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2023 වර්ෂය වෙනුවෙන් සකස්කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
මේ පෙල ගැස්ම හරිද?සෞඛ්‍ය කම්කරුවන්ගේ අවශ්‍යතා ප්‍රථම ව තිබිය යුතු කරුනක්.පෙර පාසැල් තෑගි වසරේ අන්තිමට තිබිය යුතු දෙයක්.වීදි ලාම්පු අළුත්වැඩියාව මුලට ආයුතු දෙයක්.පියවරෙන් පියවර සැලසුම් සහගතව ඕනි.සාකච්ඡා කරලා සංශෝධනත් සිදු කරන්න.අනුමතයි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
තව දුරටත් අවශ්‍ය සංශෝධන වේ නම් සාකච්ජා කරලා ඇතුලත් කරමු.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන ලද , යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ** 2023 **වර්ෂය වෙනුවෙන් සකස්කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමටත් අවශ්‍ය වේ නම් තවදුරටත් සංශෝධන ඇතුලත්කිරීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

05-22.කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022 වර්ෂය භාණ්ඩ සමීක්ෂන වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබාදීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022 වර්ෂය භාණ්ඩ සමීක්ෂන වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.අදාල වාර්තාව සභාගත කරමි.
ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

එසේම මේ හාන්ඩ සමීක්ෂනයේ නිර්දේශ අනුව භාණ්ඩ වෙන්දේසියටද දිනයක් යොදා ගමු.අදාල භාණ්ඩ ලැයිස්තුව පහත දක්වමි.2023.02.28 දින පෙ.ව.10.30 ට මෙම සභාවේදී වෙන්දේසි කටයුත්ත නීත්‍යානුකූලව සිදු කරනවා. ඒ සඳහාත් සහභාගී වෙන්න.**අදාල හාන්ඩ ලැයිස්තුව පහත පරිදි වේ.**

| අනු අංකසභාපති, ප්‍රාදේශිය සභාව, කුරුවිට. | භාණ්ඩ හා උපකරණ | ප්‍රමාන |
|---|---|---|
| 01 | කාර්යාලයෙන් ගලවා ඉවත් කරන ලද -කර්ටන් බාර් | 05 |
| 02 | කාර්යාලයෙන් ගලවා ඉවත් කරන ලද -කර්ටන් නෙට් රෙදි | 05 |
| 03 | කාර්යාලයෙන් ගලවා ඉවත් කරන ලද -කර්ටන් බදින පටි | 10 |
| 04 | කාර්යාලයෙන් ගලවා ඉවත් කරන ලද -කර්ටන් රෙදි | 10 |
| 05 | කාර්යාලයෙන් ගලවා ඉවත් කරන ලද -තැල්ල (දුඹුරු පාට) | 02 |
| 06 | කැබ්රථයෙන්( අංක 59-9978) ගලවා ඉවත් කරන දෙරවල් | 04 |
| 07 | තොරන සඳහා භාවිතා කරන ලද බැනර් | 05 |
| 08 | ත්‍රීපේස් මෝටරය | 01 |
| 09 | වාහන අමතර කොටස් (යකඩ) | |
| 10 | දෙමහල් ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ තාවකාලිකව සවිකර තිබූ වහලයේ යකඩ කොටස් | |
| 11 | ජේ.සී.බී. පොඩි කුල්ල(අඩි 2) | 01 |
| 12 | පාලමකින් ගලවා ඉවත් කරන ලද කේබල් | 02 |
| 13 | අත්ට්‍රැක්ටරයේ වේලරේ තහඩුව | 01 |
| 14 | අත්ටැක්ටරයේ වේලරේ | 01 |
| 15 | උළු කැට | 3000 |
| 16 | ලොකු ටැක්ටරයේ අළුත්වැඩියා කටයුතු කිරීමේදි ගලවා ඉවත් කරන ලද වැසියේ යකඩ කොටස් | 04 |
| 17 | බැනර් සඳහා භාවිතා කළ රෙදි සහ කර්ටන්(නිල්පාට) | |
| 18 | ගලවා ඉවත් කරන ලද යකඩ තහඩු සහිත දොර | 01 |

| අනු අංක | භාණ්ඩ හා උපකරණ | ප්‍රමාන |
|---|---|---|
| 01 | සවල් | 03 |
| 02 | මුල්ලු | 01 |
| 03 | රේක්ක | 01 |
| 04 | ෆෑන් | 01 |

| | | |
|---|---|---|
| 05 | ග්‍රීස් ගන් | 01 |
| 06 | ස්ටැන්ඩ් ෆෑන් | 01 |

| | | |
|---|---|---|
| 01 | බැටරි | 03 |
| 02 | කසල බාස්කට් | 10 |
| 03 | ත්‍රිවිල් ටයර් ඩීසල් | 03 |
| 04 | ත්‍රිවිල් ටයර් පැට්‍රල් | 04 |
| 05 | 600*16 ටයර් | 11 |
| 06 | ට්‍රැක්ටර් මහරෝද ටයර් | 04 |
| 07 | කැබ්රථ ටයර් | 04 |

| | | |
|---|---|---|
| 01 | විසිකැති | 02 |

| | | |
|---|---|---|
| 01 | රසදිය රුධිර පීඩන මානය | 01 |
| **02** | හිස් බෙහෙත් බෝතල් | 485 |

| | | |
|---|---|---|
| **01** | පොඩි රවුම් මේස | **01** |

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව** අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022 වර්ෂය භාණ්ඩ සමීක්ෂන වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට **ත්** වෙන්දේසි කිරිමට නිර්දේශිත භාණ්ඩ 2023.02.28 දින පෙ.ව.10.30 ට මෙම සභාභූමියේදි සිදු කිරිමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

05-23.කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2023 වර්ෂය සඳහා විගනන හා කලමනාකරන කමිටු රැස්වීම පැවැත්වීමට නියමිත දිනයන් හා අදාල කමිටු නිලධාරිමණ්ඩලය සඳහා මහා සභා අනුමැතිය ලබාදීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2023 වර්ෂය සඳහා විගනන හා කලමනාකරන කමිටු රැස්වීමට පහත සඳහන් නිලධාරින් පත්කොට පහත සඳහන් දිනයන්හි දී පැවැත්වීමට යෝජනා කරමි.

(1) කමිටු නිළධාරීන්

I. පළාත් පාලන ආයතනයේ සභාපති - කමිටු සභාපති
II. පළාත් පාලන ආයතනයේ ලේකම් - කමිටු ලේකම්
III. පළාත් පාලන ආයතනයේ ගිණුම් නිළධාරි - කමිටු සාමාජික
IV. පළාත් පාලන ආයතනයේ ආදායම් පරීක්ෂක - කමිටු සාමාජික
V. පළාත් පාලන ආයතනයේ විගණන විෂයභාර නිළධාරි - කමිටු සාමාජික
VI. පළාත් පාලන ආයතනයේ අංශ ප්‍රධානීන් - කමිටු සාමාජික
VII. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිළධාරි / විමර්ෂණ නිළධාරි - කමිටු නිරීක්ෂක
VIII. පළාත් සභා අභ්‍යන්තර විගණන නිළධාරි - කමිටු නිරීක්ෂක
IX. ජාතික විගණන කාර්යාලයේ නිළධාරීන් (රත්නපුර) - කමිටු නිරීක්ෂක
X. වෙනත් අවශ්‍ය නිළධාරීන්

**(2)** කමිටු පැවැත්විමට නියමිත දිනයන්

- I කාර්තුව - 2023.03.16
- II කාර්තුව - 2023.06.15

- III කාර්තුව - 2023.09.21
- IV කාර්තුව - 2023.12.21

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
එම යෝජනාව ස්ථිර කරමි.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**
විගනන වාර්තාව මෙතෙක් ඉල්ලුවත් තාම අපිට ලැබුනේ නෑ.අළුතෙක් ආව එක සභාවට දාන්න.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන ලද , යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2023 වර්ෂය සඳහා විගනන හා කලමනාකරන කමිටු රැස්වීමට ඉහත සඳහන් නිලධාරින් පත්කොට ඉහත දක්වා ඇති දිනයන්හි දී කමිටුව පැවැත්වීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

**2023.02.07 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-24 හි සභා උද්‍ධෘතය**

**05-24.** ඇස්තමේන්තු
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

05-24-01 සිට 05-24- 22 දක්වා පහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් යෝජනා කරමි.
**05**-24-01.මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම -රු.2700000.00

**(ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා )**

**05-24-02.පුස්සැල්ල කපුගහවත්ත පාර පළුදු ස්ථාන කොන්ක්‍රිට් කිරීම. රු.1800000.00**
(විසල් ජල ව්‍යාපෘතිය )

05-24-03.පුස්සැල්ල වලව්වත්තපාර තාරදැමීම. රු.1200000.00

(විසල් ජල ව්‍යාපෘතිය )

**05-24-04.**මෙනේරිපිටිය පන්සල පාර කොන්ක්‍රිට් කිරීම **රු.2200000.00**

(විසල් ජල ව්‍යාපෘතිය )

**05-24-05.**පරකඩුව නිල්මිණිඋයන මාර්ගය කොන්ක්‍රිට් කිරීම **රු.2000000.00**

(විසල් ජල ව්‍යාපෘතිය )

**05-24-06.පුස්සැල්ල දොලගොඩැල්ල පාරේ අබලන් පැතිබැම්ම ඉදිකිරිම රු.1500000.00**
**05-24-07.පුස්සැල්ල කජුගස්වත්තපාර නඩත්තු කිරීම රු.1500000.00**
**05-24-08 කජුගස්වත්ත ළිඳ ප්‍රතිසංස්කරනය කිරිම රු.200000.00**

**05-24-09. තිරිවාන ගලබඩවත්ත මාර්ගයේ පළුදු තැන් කොන්ක්‍රීට් කිරීම රු.1000000.00**

05-24-10. .පුස්සැල්ල උඩගලහේන හා අභය පෙදෙස මාර්ගය

මතුපිට අළුත්වැඩියා කිරීම (විසල් ජල ව්‍යාපෘතිය ) -රු.431361.16

**05-24-11.හොලීපිටිය ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ අනතුරට පත් වහලය**

අළුත්වැඩියාකිරීම. - රු.32665.86

05-24-12.කදන්ගොඩ ආනන්ද බෝධි මාවතමතුපිට අළුත්වැඩියා කිරීම -රු.967968.49

(විසල්)

05-24-13.කදන්ගොඩ 84 ජනපද මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම -රු.461625.97

(විසල් ජල ව්‍යාපෘතිය)

05-24-14.පුස්සැල්ල කොක්ඕවිට මාර්ගය

මතුපිට අළුත්වැඩියා කිරීම (විසල්) -රු.1866842.11

05-24-15.උඩුකුඹුර මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම -රු.1153000.00

5-24-16.පැරඩයිස් මාර්ගය 1,2,4, රු.6 පටුමග අළුත්වැඩියා කිරීම රු-775304.34

(විසල් ජල ව්‍යාපෘතිය )

05-24-17. බණ්ඩාරවත්ත 1.2.3.4,5.6.7.8 පටුමග අළුත්වැඩියා කිරිම රු.1880967.96

(විසල් ජල ව්‍යාපෘතිය )

05-24-18. බටුහේන වෛද්‍ය පියයට යන පාර අළුත්වැඩියා කිරීම රු.500000.00

05-24-19. දික්හන ඇල ජල ව්‍යාපෘතිය අළුත්වැඩියා කිරිම රු.382511.85

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා**

**05-24-20.**පිටකන්ද ජල ව්‍යාපෘතිය අළුත්වැඩියා කිරිම රු. 248376.00

**05-24-21.වනඉදලකැටිය පූජා මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම රු.640425.24**
**(ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා)**
**05-24-22.සංජීව මහතාගේ නිවස අසල සිට අධිකාරිය පන්සල පාර කොන්ක්‍රීට් කිරිම රු.711289.55**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
එල්ලාවල බහුකාර්ය ගොඩනැගිල්ලේ පුස්තකාලය හදන එකේ ඇස්තමේන්තුව හදලා තියෙන්නේ. ඒක න්‍යාය පත්‍රයට දාලා නෑ.ඒක ඇතුලත්විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

ගිය මාසේ සභාවේ මම කිව්වා අර කඩුකාරදෙනිය බාර කැඩිලා.දැන් තවත් කැඩෙනවා. ඒකේ කටයුතු ඉක්මන් කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
05-24-1 සිට 05-24-22 දක්වා ඉහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් අවශ්‍ය අවස්ථාවන්හිදි ඇස්තමේන්තු සම්බන්ධව නැවත නිලධාරි වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු නීත්‍යානුකූලව සිදු කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2023.02.07 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-24 හි සභා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

## 06.කාරක සභාවල වාර්තා

06-01 මුදල් කමිටු වාර්තාව -23.01.09 වාර්තාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

23.01.09 වන දින මුදල් කමිටු වාර්තා සඳහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය :-**

23.01.09 දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීම සුදුසු බවට යෝජනා ස්තිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් අංක 2 යටතේ වන මාසික වැටුප්ගෙවීම සම්බන්දව ගැටළුව විමසූ අතර එය නීත්‍යානුකූල බව හා නිවැරදි බව සාකච්ජාවිය. එසේම අංක 09 යටතේ ජලමෝටරය සඳහා මිල ගනන් කැඳවීමේදී එහි අශ්වබල ධාරිතාවය ද ඇතිව මිලගනන් කැඳවියයුතුබව දැනුවත් කරන ලදී.අංක 8 ගලිබවුසරය පිලිබඳව,අංක 10 ඉන්ධන වියදම් පිලිබදවද සාකච්ජ විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා අදහස් දක්වමින් ඉන්ජින් සීල් කරන පුලාස්ටික් ටැග් ඇති අතර ඒවා භාවිතය සුදුසු බවට අදහස් දක්වන ලදී.සීල් කිරිමක් වන බැවින් වඩා විශ්වාස ලෙස කටයුතුකලහැකිබව පැවසීය. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් ඉන්දන ඇනවුම් කිරීමේ ක්‍රමවේදය ක් සැකසිය යුතුබවත් මෙම අංක යෙදී තිබෙන පිලිවෙල අක්‍රමවත් බවක් දිස්වන බවත් සඳහන් කලේය.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 23.01.09 දින මුදල් කමිටු වාර්තා සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව (2023.01.24 )

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

2023.01.24 දින <u>කාර්මික කමිටු වාර්තාව</u> සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

23.01.24 දින කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි..

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී දයා කස්තුරි මිය-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 23.01.24දින <u>කාර්මික කමිටු වාර්තාව</u> සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායක කමිටු රැස්වීම් වාර්තාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**ඉදිරි සබාවට යොමු කරමි.**

## 07 <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

07-01 -2022 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

2022 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

**මෙම ලැබීම් සාරංශයේ සිරස් තිරස් එකතුව සම්බන්ධව ගැටළුවක් පවතිනවා. ඒ එකතුව නිවැරදිව ගැලපී එන්නේ නෑ.මේ සම්බන්ධව මීට ඉහතදීත් දැනුවත් කලා.වැය සාරාංශයෙත් එහෙමයි.ආදායම් අයකිරීමෙ ප්‍රගතියේ මුළු ලැබිම් හිඟය ,වරිපනම් බදු වල හිඟය සමග බැලුවාම ඒ කත් ගැටළු තියෙනවා.මේ හිඟ එකතු වෙලාත් මදි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

ජංගම සේවා තියලා එකතු කරනවා.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2022 දෙසැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 07-02 2023 ජනවාරි මස ගෙවීම් වාර්තාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2023 ජනවාරි_මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-

2023 ජනවාරි මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2023 ජනවාරි මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**08.**වෙනත් කරුණු

**8-01.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**නිදහස් දවසේ අපේ සභා දේපලකට හානියක් සිදු උනා.එල්ලාවල පිටකන්ද මාර්ගය සභාවේ මාර්ගයක්. කිරිඅතුල වත්ත පී.ඒ. චන්ද්‍රදාස නමැත්තා මේ මාර්ගයේ කාණුවේ වලවල් කැපුවා.කම්බි කණු ගහන්න. කාර්මික නිලධාරි පරික්ෂා කරලා මේක අත්හිටෙව්වා. නමුත් නිදහස් දවසේ කම්බිකණු 7 ක් ගැහුවා.අපි සභාවට පැමිණිලි කලා.මේ හැරිල්ල නිසා පාරේ කාණුව විනාශ වෙනවා.මේවා ආරක්ෂා කරන්න.මේ පිලිබඳව නීතිමය කටයුතු කරන්න.**

**<u>08-02.</u>**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

**පලාත් පාලන මැතිවරනය තියන්න ගැසට් කරලා දිනත් නියම කරලා .නමුත් මේවන තුරුත් මෙකේ අපේක්ෂකයෝ විධිහට ඉල්ලන සමෘර්ධි නිලධාරින් ඒ ඉල්ලන කොට්ඨාශෙම වැඩ කරනවා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා</u>

**මම නම් නිවාඩු ඉන්නේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

**ඔබතුමාට නෙමෙ කියන්නේ.මේ සම්බන්දව ප්‍රාදේශීය ලේකම්ව දැනුවත් කරන්න.මේ නිලධාරින්ට පුළුවන් ජනතාවට බලපෑම් කරන්න.ඒ නිසා මේ ඉල්ලීම සාධාරන මැතිවරනයක් සඳහා මේ ගම්වල ඉන්න කොඨ්ඨාශවල ජන්දය ඉල්ලන නිලධාරින්ව ඒ කොඨ්ටාශ වලින් ඉවත්කරන්න.නැත්නම් බලපෑම් හැමදේටම.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා</u>

**මම නම් නිවාඩු ඉන්නේ.ප්‍රාදේශිය ලේකම් පවරන කටයුතු වැඩබලන කටයුතු වගේ කරනවා.ආයතන සංග්‍රහය අනුවයි අපි කටයුතු කරන්නේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

**මම නම් කියන්නේ සමස්ත රාජ්‍ය නිලධාරින් ඕනෑම තනතුරක අයෙක් ජන්ද අපේක්ෂකයෝ විධිහට ඉල්ලීම සුදුසු නෑ. රජයේ නිලධාරින්ට මේ කුමනහෝ මැතිවරනයකට එන්න දෙන්න එපා.සියළු පහසුකම් අරන් අවභාවිත කරයි.ඒ නිසා සමස්ත රාජ්‍ය නිලධාරින්ම මේවාගෙන් ජන්දය ඉල්ලීමෙන් ඉවත්කල යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා</u>

**මේවා අයිතිවාසිකම්.මානව හිමිකම්.ආයතන සංග්‍රහය අනුව සියළු රාජ්‍ය සේවකයන් පවතින රජයට පක්ෂ වියයුතුයි.නමුත් ඒක මැතිවරන අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත්වීමට බාධාවක් නෑ.නීත්‍යානුකූලයි.රාජ්‍ය සේවකයෙකු මැතිවරන අපේක්ෂකයෙකු ලෙස ඉල්ලනවානම් ඒ සඳහා වෙනම නීතිමය තත්වයක් තියෙනවා.ඒ විධිහට කටයුතු කරන්නේ.ඒ නැතිව රජයේ සේවකයාටත් තියෙනවා සාමාන්‍ය මිනිස්සුන්ට තියෙන දේශපාලන අයිතිවාසිකම්.ජන්ද අයිතිය නතරකරන්න බෑ.ගැටළු තියේනම් වෙනම පුද්ගලිව දන්වලා විසඳගන්න පුළුවන්.ඒ නැතිව මේවගේ දේවල් ලියලා නොදැනුවත්කම පෙන්නලා හැල්ලුවට ලක් කරන්න එපා.ආයතනය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

**මෙතන සමෘර්ධි නිලධාරින් පිලිබඳවයි කතා කලේ.නීතිරීති අනුව කටයුතු කලාට ඇත්තටම දේශපාලනයට මැතිවරනයට බලපෑම් කරන්න ඒ අයට පුළුවන්.කැළුම් මන්ත්‍රීතුමාත් කියනවා බලපෑම් සිදු වෙනවා කියලා.මේවා කියන්න සුදුසුම තැන මේ සභාව.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

**අදහස් ඉදිරිපත්කල හැකියි සභාවේ. විග්‍රහකර බලා ඉදිරි ක්‍රියාමාර්ග ගමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රණසිංහ මහතා

**මෙවැනි දේ සම්බන්ධබ ක්‍රියාත්මක වීමට බලයක් සභාවට නෑ.සොයාබලලා කටයුතු කරන්න.**
**08-03.**
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

**අපේ කුරුවිට මහජන වැසිකිලිය ඇස්තමේන්තුව යවලා තියෙන්නේ අනුමැතියට.ඒකට අනුමැතිය දුන්නාම, අත්‍යාවශ්‍ය නිසා කඩිනමින් හදන්න ඕනි නිසා සීමිත ටෙන්ඩර් කැඳවලා හදමු.අවශ්‍යතාවය මත.**

09.හදිසි යෝජනා
09-01. පැරඩයිස් පොඩිවැවේ මැණික් ඉල්ලම් ඉවත්කිරීමේ ව්‍යාපෘතිය සම්බන්දව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා .

පැරඩයිස් පොඩිවැවේ මැණික් ඉල්ලම් ඉවත්කිරීමේ ව්‍යාපෘතිය සම්බන්දව සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තුරි මිය.
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා .

මේ සම්බන්ධයෙන් ලේක් සයිඩ් පැරඩයිස් කුරුවිට සම්පත් සුහසාධක සංගමය මගින් ලිපියක් යොමු කර තියෙනවා.ඒ මගින් රත්නපුර කුරුවිට ප්‍රදේශයේ ධනවත් ව්‍යාපාරික පිරිසක් සංවිධානගතව පැරඩයිස් වැව පතුලේ ඇති රොන්මඩ සහ වැලි ඉවත්කරන බව අඟවමින් අඩි 30 ක පමන ගැඹුරට පිහිටා ඇති මැණික් ඉල්ලම් යන්ත්‍රෝපකරන භාවිතා කර වෙනත් ප්‍රෙද්ශයකට රැගෙන යාමට සැලසුම් කර ඇති බව දැනුම් දී ඇත.මේ හේතුවෙන් විශාල අපහසුතා රැසකට තම ගම්මානය ගොදුරුවන බවත් තම ජන ජීවිතයට පරිසරයට මේ තුලින් හානිවන බවත් දැනුම් දීඇත.මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට කටයුතු සලසන ලෙසත් ඉල්ලා ඇත.එසේම මේ වැවේ අතිතයේ සිටම ගමේ මිනිස්සු කූඩයක් අරගෙන කිමිදිලා ඉල්ලම්ටිකක් අරන් යම් මුදලක් හොයාගත්තා. ඒක කව්රුත් දන්නවා. නමුත් මේ විධිහට බාහිර පිරිසකට වැව බදු දුන්නා වගේ කලාම ව්‍යාපෘති මුවාවෙන් ගමේ මිනිස්සුන්ට කිසිම පලක් නැතිව යනවා.සභාව දැනුවත්කලා.මේ සම්බන්දව මැදිහත්විමක් කරමු.ලිපිය සභාගත කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා .

එම යෝජනාව ස්ථිර කරමි.දින 4ක 5ක ඉදන් ගමේ පිරිසක් කැපුවා. මේ වෙනකොට ඉහලින් මම හිතන්නේ දේශපාලන බලපෑම් ඇති වැව සංවර්ධනය කරනවා කියලා වැව ගොඩදාන්න

යනවා.මේ ප්‍රයේ සභාවේ මන්ත්‍රීලා විධිහට මේකට ඉඩදෙන්න එපා. මමනම් මෙතනදි මිනිස්සු පැත්තේ.ඕනැම අභියෝගයක් භාරගන්න මමනම් ලෑස්තියි.මම ඉන්නේ ජනතාවගේ පැත්තේ.නැත්නම් ඉඩංගොඩ මැණික් නිධියට උනදේ වෙයි.සභාවට යම් මුදලක් ලැබුනත් වැඩක්නෑ ගමේ ජනතාවගේ ජීවිතේ ගැටගහගන්න තියෙන අවස්ථාව නැතිවෙනවනම්.මෙතනත් ගුවන්විදුලි සංස්ථා ඉඩම් වගේ වෙයි.යන්ත්‍ර සූත්‍ර දාලා වැඩ කරයි.ඒ ඉඩමෙත් සංස්ථා ඉඩමේ ලඟ ගෙවල් ඉරි තලලා.අදටත් පැරඩයිස් ඒ ඉඩම් වලට වතුර නෑ.ගම ඉවර උනා විතරයි.මේ වැවත් පිට අයට දුන්නාම අන්තිමට ඉතිරි වෙන්නේ විනාශ උන ගමක් විතරයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය.</u>

මේ වැඩේට ගමම විරුද්ධයි.ලොකු අවධානමක් ගමට.අඩි 30 ක් යටට යනකොට ළඟ ගෙවල් ඉවර වෙයි.වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ මේක පටන් ගත්තේ.ගෙවල් 312 ක් තියෙනවා.ලිං තියෙනවා මේ ගෙවල්වලට සභාවෙන් වතුර දෙන්නේ මේකෙන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චන්ද්‍රා බණ්ඩාර මිය.</u>

පැරඩයිස් වැවට උල්පත් අඩුයි.වැසිජලයයි රඳාගෙන තියෙන්නේ.වැවේ රොන්මඩ මේ කටයුත්තට අත්‍යාවශයයි.ජලය රඳා පවත්වාගන්නේ රොන් මඩයි. මේ මඩ ඉවත්කරනවා කියන්නේ වැව හිඳෙනවා.ගමවෙනුවෙන් මේ කටයුත්තට විරුද්ධත්වය පල කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

සභාව පුන පුනා කිව්වා කුරුගංමෝදර මැනික් සම්පත මෙවැනිම කටයුත්තක් ගැන.නමුත් ඒ හඩ පුස්සක් උනා.පැරඩයිස් කටයුත්ත ගමේ ජනතාව බෝඩ් ගහලා තියෙනවා.මේ වැවේ අයිතිය ගමේ ජනතාවටයි තියෙන්නේ.ඉල්ලං ගන්නවානම් ගමේ ජනතාවයි යැපෙන්න ඕනි.පිට ධනවත්තු නෙමෙයි.මේ සභාව ගමු තීන්දුව.මේ විරෝධය වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ඉංජිනේරු,ගොවිජන සේවා මධ්‍යස්ථානය ගොවිජන කොමසාරිස්ට දිස්ත්‍රික් ලේකම්ට ගරු ආණ්ඩුකාරතුමාට මෙය දන්වා අරින්න.එසේම මේ වැව අයත් කුරුවිට **ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට.මේ වැව ප්‍රතිසංස්කරනය කරනවා නම් මෙම සභාවේ පූර්ව අනුමැතියක් නැතිව කරනවා නම් අපි විරුද්ධයි.මේ දැනුම් දීමේ පිටපතක් අපිටත් දෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා .</u>

අපේ අත්දැකීම් අනුව මෙවැනි දේවල් කීපයක් මේ ප්‍රදේශයේම උනා. ගම්වල සම්පත් පිටින් ඇවිත් අරන් යනවා.අපේ ගම්වල ජනතාව දැඩි ආර්ථික අපහසුතාවල ඉන්නේ.රට සංවර්ධනය වෙන්න ඕනි තමා.රුවන් මන්ත්‍රීතුමා යෝජනා කලා මේ වැව වටා ඇවිදින මංතීරු හදන්න.මේවා වෙන්න ඕනි. නමුත් ඒ මුවාවෙන් ඇතැමුන් ඛනිජ සම්පත් කොල්ලකන්න ලෑස්තිවීම අනුමත කලනොහැකියි.අසංක මන්ත්‍රීතුමා කීවා වගේ අපි 45 ම මේ වෙලාවේ ජනතාව එක්ක හිටියොත් ඇත්තටම මේ දේ කරන්න බෑ.අර කුරුගහ නියාමක පතල් සමෘද්ධි අංශයට දුන්නා වගේ අහිංසක ජනතාවටත් යමක් ලැබෙන ක්‍රමවේදයක් හැදිය යුතුයි.එසේම රොන්මඩ නිසා ජලය රඳා පැවතීම මේවා විද්‍යාත්මකව සලකා බැලිය යුතු කාරණා.වැව මතුපිට උදැසනට තියෙන පිණි කට්ටය.ප්‍රභාසංස්ලේෂනයට දායක වෙනවා.මේ වැව පරිසර පද්ධතියට සෘජුවම බලපෑම් කරනවා.මෙතරම් ගමට වටින මේ වැව සම්බන්ද කටයුත්තට තනිවම දේශපාලන අධිකාරියට මෙතරම් දෙයක් කරන්න බෑ. අනිවාර්යෙන් පරිපාලනයත් සම්බන්ධ ඇති.මේ තත්වය මත අපි 45 එකතු වෙලා මේකට විරෝධය පාමු.විරෝධතාවක් පල කිරිමට යාමට උනත් සූදානම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා .

මේ වත්තේ වැව රාජ්‍ය වැවිලි සමාගමට අයත්.සොයිසා කමිටුව මගින් හැදුවේ.පොඩි වැව ලොකු වැව දෙකයි. පොඩිවැව බන්ටෙක තාම තියෙනවා.නමුත් පසුකාලීනව මේ පොඩිවැව අහිමිවෙලා ඒක ගැන සඳහනක් පවා නැති විධිහට වාර්තා කරලා.වැව් බන්ටෙක තියෙනවා.
ඒ ඉඩම් විකුනලා කලින් තිබුන ජල උල්පත් දැන් සිඳී ගිහින්. මේ විධිහට මේ වැවත් අහිමිවෙයි.මේ ප්‍රෙද්ශයේ ජනගහනය වැඩියි. උෂ්නත්වයත් වැඩියි.වැව නිසා රස්නය පාලනයක් වෙනවා.වෙන්දේසි ඉඩමේ වෙනම කොටසක් සභාවට තිබුනා.ඒකත් අල්ලලද?වැව අයිනේ ඒක තියෙන්නේ.ඇත්තටම නුවර එලිය නගර සභාව ආදර්ශයක් කරගෙන අපිත් යම් වැඩක් කරමු. සභාවටත් ආදායමක් එන.මේ රක්ෂිතයේ අපේ කොටසේ.
මේ මැණික් වැඩේ පිට අයයි මෙහේ අයයි දෙකම ඉන්නවා.මැණික් තියෙනවා.මේක අසාධාරනනම් විරුද්ධ වෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය.

සභාවෙන් කරන සංවර්ධන කටයුත්තක්ලෙස කරමු.රැකියා කීපයකුත් දෙන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා .
මේ ගැන බෙනර් දාලා මිනිස්සු.විරෝධය පාලා.පොලිසියෙත් මේවාට එකතු වෙලා කටයුතු කරන අය ඉන්නවා.ගමේ මිනිස්සුත් ඉන්නවා.නමුත් මන්ත්‍රිලා ඇයි?.ජාවාරම් බෑ.මේ සභාවේ මන්ත්‍රිලත් ඉන්නවා.වැවේ පතල් කපන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා .

චන්ද්‍රා මන්ත්‍රිතුමිය කීවා රොන් මඩ ඉවත් කලොත් වැව ඉවරයි කියලා.ඒක ඇත්ත. අපේ පැරැන්නොත් කියලා තියෙනවා එහෙම.ප්‍රතිසංස්කරනය කරන්න කියලා රොන්මඩ ඉවත් කරන්නේ විෂය දැනුම නැතුව.ඉහතදි මේ සම්බන්ධව උපදෙස් ගත්තාම රොන්මඩ ඉවත්කරන්න එපා කියලා කීවේ.විපක්ෂ කායකතුමා චෝදනා කලා සභාවේ මන්ත්‍රිවරුත් ඉන්නවා කියලා මේ කටයුත්තේ.මමනම් සම්බන්ධ නෑ.පුද්ගලිකව හිතට එකඟව කියන්නේ.

මොකද සමාජය හිතයි අපිත් ඉන්නවා කියලා.මේ සභාවේ මම හිටියා කියලා රුපියලක වැරදි වාසියක් අරන් නෑ.උදව්වක් අරන් නෑ. උදව්වක් කරන්න ගියත් අතේ මුදලින් තමා කරන්න වෙන්නේ.ඒ නිසා නික්ම යන්නෙත් සතුටින්.
වැව විනාශය ගමට ලොකු හානියක්.මම මේවට නැති උනාට එතනවෙන දේ මම දන්නවා.පරිසර හානි ලොකු බැකෝදැම්මොත් වැව විනාශවෙයි.ගමේ හාමුදුරුවොත් මේකට විරුද්ධයි.ගොවි නියෝජිතයෝ විරුද්ධයි.මොන විධිහට කලත් කෙරෙන්නේ නම් මේකම තමා.මේ විධිහට ගමේ අයටත් කීයක් හරි හම්බ වෙනවා.මේකට විරුද්ධවෙලා අපි පෙරමුන ගත්තොත් ගමේ ජනතාව අපිට විරුද්ධතා දක්වයි. හොරා කියයි.ඒ නිසා අපි ජනතාවට සහාය දෙමු.ජනතාවම විරෝධතා දක්වයි.යි. ඒවට සහාය වෙමු.

මම ගරු සභාපතිතුමාට ලිපියක් දුන්නා.අනතුරු ගසක්සම්බන්ධව .ගමේ අසරන පවුලක්. ඒඅයට පොල්ගස්තුනක් ඇදලා බඳින්න කියලා.නියෝග ඇරලා අනතුරුයි කියලා.නමුත් මේ අවස්ථාවේ ඒ අයට රු.20000.00ක් මුදලක් නෑ. ගස් ඇදලා බඳින්න රු. 20000.00ක් යනවළු.මාස 6ක් කාලයක් කල් ඉල්ලනවා.ඉල්ලීම සභාපතිතුමාට දුන්නා.ඇඩි අනතුරක් නැති නිසා මේකට කල් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා .

**මම යෝජනා කලේ ඇවිදින මං තිරු හදන්න.ඒක වාරිමාර්ගෙට මැණික් සංස්ථාවට ගිහින් තියෙන්නේ.මේක වෙනම ව්‍යාපෘතියක්.කෝටිපති ව්‍යාපාරික අයට දෙන්න හදන.ඒ අය තමා එතකොට සියල්ල කරන්නේ.වැවට අක්කර 6ක් තිබුනේ. දැන් නෑ. අනවසර ඉදිකිරීම්.මැණික් සංස්ථාවෙන් මැන්නා.තාම බුලත් මුදලාලිගේ බාරේ තියෙන්නේ.ඒ ඉඩමට අයිති එකක් වැවත්.භුක්ති විදින්නේ ගොවිජන සේවා එක.ගම එක්ක කතා කරන්න ඕනි.නියාමන ක්‍රමයට යනවා නම් ඒ ජනතාවට හිමිවෙන ලාභය ගැන බලන්න ඕනි.ගමේ විශාල කොටසක් ගුවන් විදුලි සංස්ථාවට දුන්නට අන්තිමට වතුරත් නැති උනා.වැවේ සොරොව්වේ යතුර තියෙන්නේ හමුදා කඳවුර බාරේ.වෙනම වාරි ඇලක් හැදුවොත් වතුර දෙන්න පුළුවන්.දැනට තියෙන ගෙවල් වලට අලාභයක් නොවෙන විධිහට වැවේ කටයුතු කරන්න ඕනි.අපි ලියුම් ගහලා හරි මේවා කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා .

**ජනතාව වැවේ බාල්දියක් ගහලා එදිනෙදා කීයක් හරි හොයාගත්තට දැන් ඒ තත්වය නෑ.සභාවේ ඉන්න ඇතැමුන් යන්ත්‍ර භාවිතයෙන් කටයුතු කරලා දැනටත් කරනවා.**

**මේ අවස්ථාව වන විට සභාවේ දැඩි ගෝෂාකාරි තත්වයක් පැවතිණි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**මේ යෝජනාවට අපි අත ඉස්සුවා.ඒ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන්.නමුත් මේ වෙන දේවල් පිලිබඳ ඇත්තටම අප්‍රසාදය පල කරනවා.පොදු අරමුනක් තිබිය යුතුයි යෝජනාවල.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා .

**මේ මැණික් කැණීම් පිලිබද අත්දැකීම් රැසක් තියෙනවා.මේක කිසිවෙකුට ගරන්න දෙන්න එපා.**
**දෙනවනම් සමෘර්ධි සමිති කණ්ඩායම් වලට වගේ දෙන්න. අලෙවි කරන්න ක්‍රමයකුත් හදාගන්න.කළු ගගේ මැනික් ගැරුවේ බදුල්ලෙන් ඇවිත්.අපි අප්‍රසාදය පල කලාට අන්තිමට ඒ වටිනාකම් සියල්ල පිටට ගියේ.මැණික් සංස්ථාව අත ගැහුවොත් පූර්න විනාශයක් විතරයි.වැවත් නැතිවෙයි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-

**මේ වැවත් වැවේ සම්පතුත් ගමට ඕනි.ඒ සම්බන්ධ ආයතන වලට කතා කරලා සභාවෙනුත් දෙයක් කරමු.බලපත්‍ර නිර්නායක අරන් නිසා අපිට පහසු වෙන්නෑ.මැණික් කපන එක හොඳයි ක්‍රමවේදයකට.විනිවිදව.අවශ්‍ය සංවිධානයක් වෙලා කටයුතු කරමු.ආණ්ඩුකාරතුමාටත් දැනුම් දෙමු.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**ගමට ප්‍රතිලාභ ඕනි .මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා එක්ක කතා කරමු. මේ තත්වයට සභාවේ විරුද්දත්වය දක්වන්න.සියළු ආයතන වලට දැනුම් දෙන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා ගේ යෝජනාව අනුව පැරඩයිස් වැවේ වැව පතුලේ ඇති රොන්මඩ හා වැලි ඉවත්කර සංවර්ධනය කිරීමේ මුවාවෙන්, මැණික් ඉල්ලම් යන්ත්‍රෝපකරන භාවිතයෙන් ඉවත්කර වෙනත් ප්‍රදේශයකට ගෙනයාමට සැලසුම් කර ඇති ව්‍යාපෘතිය සම්බන්දව කුරුවිට ප්‍රාදේශීය සභාවේ විරෝධතාවය පලකිරීමටත්
මෙම වැව සම්බන්ධ සියළු කටයුතු සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේද අනුමැතියක් ලබාගතයුතු අතර මෙම විරෝධය වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ඉංජිනේරු,ගොවිජන සේවා මධ්‍යස්ථානය ගොවිජන කොමසාරිස්ට දිස්ත්‍රික් ලේකම්ටහා ගරු ආණ්ඩුකාරතුමාට දැනුම්දීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

09-02. හදිසි යෝජනා

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්‍රියව ඇති වීදි පහන් අළුත්වැඩියා කිරීම සඳහා නව වීදිපහන් මිලදී ගැනීමට රු.1000000.00ක ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්‍රියව ඇති වීදි පහන් අළුත්වැඩියා කිරීම සඳහා නව විදිපහන් මිලදී ගැනීමට රු.1000000.00ක ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත්කරමි.ගරුමන්ත්‍රීතුමන්ලාගේ අත්සන් සහිතව කල යෝජනාව සභාගත කරමි.

ගරු ප්‍රාසම ප්‍රේමා ගම්ලත් මිය.

එම යෝජනාව ස්ථිර කරමි.
**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**
ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**__ගරු ප්‍රාදේශීය සභා උප සභාපතිඅනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත්කල යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්‍රියව ඇති වීදි පහන් අළුත්වැඩිකිරීම සඳහා නව විදිපහන් මිලදී ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන රු.1000000.00ක ප්‍රතිපාදන ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

09-03.නිවාඩු අනුමත කිරීම

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

ගරු ප්‍රාසම මුදිතා ශ්‍රීමතී මිය ,ගරු ප්‍රාසම අයි.කේ.කුලරත්න මහතා, ගරු ප්‍රාසම මදුශංක දේශප්‍රිය මහතා, ගරු ප්‍රාසම රංජිත් මෙන්ඩිස් මහතා ගරු ප්‍රාසම විකසිත පුෂ්පකුමාරිය මහතා ගරු ප්‍රාසම ජීවන් රණතුංග මහතා ගරු ප්‍රාසම සම්පත් බොතේජු මහතා හදිසියේ **,අසනීප වී ඇති අතර නිවාඩු ලබා දීමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

ගරු ප්‍රාසම මංගල ඩයස් මහතා

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx** ගරු ප්‍රාසම මුදිතා ශ්‍රීමතී මිය ,ගරු ප්‍රාසම අයි.කේ.කුලරත්න මහතා, ගරු ප්‍රාසම මදුශංක දේශප්‍රිය මහතා, ගරු ප්‍රාසම රංජිත් මෙන්ඩිස් මහතා ගරු ප්‍රාසම විකසිත පුෂ්පකුමාරිය මහතා ගරු ප්‍රාසම ජීවන් රණතුංග මහතා ගරු ප්‍රාසම සම්පත් බොතේජු මහතා හදිසියේ **,අසනීප වී ඇති අතර නිවාඩු අනුමත කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තූතිය.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**
අද දින මහා සභාවට සහභාගී වී සහාය දුන් සියළු දෙනාට ස්තූතිය පල කරමි.
සභාවේ කටයුතු ප.ව. 1.00 ට ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී - (දැ.ගැ.පි)

<u>න්‍යාය පත්‍රය</u>

- සභාපතිතුමා මුලසුන ගැනීම
- ආගම සිහිකිරීම

01. පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.
 01-01.2023.01.04 මහා සභා රැස්වීම් වාර්තාව
 02.2023.01.11 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

02.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -

03.ප්‍රාදේශිය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන -ර/ පත්බේරිය නාරද ම.ම.විද්‍යාලය ජාතික පාසැලක් බවට පත්කිරිම අයවැය වාර්තාව පිලිබද කලාප අධ්‍යාපන කාර්යාලය මගින් යොමුකරඇති ලිපිය

**04.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

05.<u>**යථා පරිදි කල් දී ඇති යෝජනා-**</u>

06.

**05-24.** ඇස්තමේන්තු

**06.**<u>**කාරක සභාවල වාර්තා**</u>

06-01 මුදල් කමිටු වාර්තාව -23.01.09
06-02 කාර්මික කමිටු වාර්තාව- 23.01.24
06-03.කුඩානගර ජල සම්පාදන කමිටු වාර්තා

**07** **ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

07-01.2022 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

07-02. 2023 ජනවාරි මස ගෙවීම් වාර්තාව

**08.වෙනත් කරුණු**

**ස්තූතිය .**

ප්‍රේමරත්න මල්කැකුල,
සභාපති,
කුරුවිට ප්‍රාදේශිය සභාව,
කුරුවිට.